## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ (පැයකට ගෙවීමේ පදනම මත)

**1. <u>කාර්මික ශිල්පී (ශල්‍යාගාර)</u>**

**සුදුසුකම්:**

I. a. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් වසර දෙකක (02) ශල්‍යාගාර කාර්මික ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

b. ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

II. a. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන වසර දෙකක (02) ශල්‍යාගාර කාර්මික පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

b. ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

III. a. ශ්‍රී ලංකා යුධ හමුදා වෛද්‍ය බලකාය , සෞඛ්‍ය අමාත්‍යාංශය හා නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය විසින් මෙහෙයවන ලද වසර දෙකක (02) පූර්ණ කාලීන ශල්‍යාගාර කාර්මික ශිල්පී සහතික පත්‍ර පාඨමාලාව හදාරා තිබීම.

සහ

b. ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

IV. a. තනතුරෙහි කාර්යභාරයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**<u>පොදු කොන්දේසි :</u>**

1. කාර්මික ශිල්පී (ශල්‍යාගාර) තනතුර වෙනුවෙන් එක් පැයක් සඳහා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ 2017.06.02 දිනැති චක්‍රලේඛ අංක TA/G/PSM/13/2016 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.

2. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2025.03.10** දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

3. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සතුවේ.

4. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී යොමුකරනු ලබන හෝ නියමිත ආකෘතියට අනුකූල නොවන හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. මෙම කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාලයීය රෝහල් කාර්යමණ්ඩලය වෙත බඳවා ගනු ලබන අතර විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නොවේ.

6. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.<u>www.kdu.ac.lk</u> / දුරකථන අංකය – 0112044555.

**www.kdu.ac.lk**